**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

***

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>ඉන්දියාවේ ASSOCHAM සහ ලංකා වාණිජ මණ්ඩලය අන්තර්ජාල සම්මන්ත්‍රණයක් සංවිධානය කරයි</u>**

පශ්චාත් කොවිඩ් ආර්ථික පුනර්ජීවනය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ඉන්දියාවේ ASSOCHAM ආයතනය සහ ලංකා වාණිජ මණ්ඩලය එක්ව සංවිධානය කළ අන්තර්ජාල සම්මන්ත්‍රණයක් ඊයේ පැවැත්විණ.

2. මෙම සම්මන්ත්‍රණයේදී අදහස් දක්වමින් ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ ආර්ථික සහ වාණිජ අංශ ප්‍රධානී සුජා කේ. මෙනන් මහත්මිය දෙරටෙහි රජයන් සහ ව්‍යාපාර අතර සාමූහික ප්‍රයත්නයන් වේගවත් ආර්ථික පුනර්ජීවනයකට ඉවහල් වන බව සඳහන් කළාය. වීඩියෝ තාක්ෂණය ඔස්සේ නව ඉන්දීය මහ කොමසාරිස්තුමා මෑතකදී ශ්‍රී ලංකා ජනාධිපතිතුමාට අක්තපත්‍ර භාරදුන් බව සිහිපත් කළ ඇය කොවිඩ්-19 වසංගතය විසින් මතුකර ඇති අභියෝගයන්ට මුහුණදීම සඳහා තාක්ෂණය නව්‍ය ආකාරයන්ගෙන් භාවිතා කිරීම වැදගත් වන බව පෙන්වා දුන්නාය. මෙලෙස අක්තපත්‍ර ප්‍රදානයක් වීඩියෝ තාක්ෂණය ඔස්සේ සිදුකිරීම ඉන්දියාවට මෙන්ම ශ්‍රී ලංකාවටද නවමු අත්දැකීමක් විය.

3. ආසියාන් ඉන්දියානු මධ්‍යස්ථානයේ ප්‍රධානී Research and Information System for Developing Countries (RIS) හි මහාචාර්ය ප්‍රබීර් දේ, ලංකා වාණිජ මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී මංජුල ද සිල්වා, ASSOCHAM හි මහ ලේකම් දීපක් සූද්, කොස්මොස් සමූහ ව්‍යාපාරයේ සභාපති සහ ASSOCHAM හි හිටපු සභාපති අනිල් කේ. අග්‍රවාල් සහ ලංකා වාණිජ මණ්ඩලයේ ප්‍රධාන ආර්ථික විද්‍යාඥ ශිරාන් ප්‍රනාන්දු යන මහත්වරුන් සම්මන්ත්‍රණයේ සෙසු සාමාජිකයන් වශයෙන් සහභාගී විය.

***

කොළඹ
ශක වර්ෂ 1942 වෛශාඛ 26
2020 මැයි 16